**ජල සම්පත් මණ්ඩලය - 2022**

**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජල සම්පත් මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1964 අංක 29 දරන ජල සම්පත් මණ්ඩල පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජල සම්පත් මණ්ඩලය 1978 වර්ෂයේ සිට පවත්වාගෙන ගොස් තිබූ කොළඹ 07, හෙක්ටර් කොබ්බෑකඩුව මාවතේ පිහිටි ඉඩම සඳහා 2013 වර්ෂයේ සිට වාර්ෂිකව රු.12,772,000ක බදු මුදලක් ගෙවා වාර්ෂික බදු බලපත්‍රයක් ලබා ගන්නා ලෙස තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම්වරයා මණ්ඩලය වෙත දැනුම් දී තිබුණද ඊට අනුකූලව කටයුතු නොකිරීම හේතුවෙන් තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් විසින් 2019 වර්ෂයේදී කොළඹ මහාධිකරණයේ නඩුවක් ගොනුකර තිබුණි. පසුව ඉඩමේ භුක්තිය පිළිබඳව සමතයකට පත්වන ලෙස නීතිපතිවරයා විසින් තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් වෙත උපදෙස් ලබා දී තිබියදී, නීතිපතිවරයාගේ උපදෙස් | 1978 වසරේ සිට ජල සම්පත් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යනු ලැබූ හෙක්ටර් කොබ්බෑකඩුව මාවතේ පිහිටි ඉඩම දීර්ඝකාලීන බදු පදනම මත ලබා ගැනීමට මණ්ඩලය විසින් ඉල්ලීමක් කරනු ලැබුවත් තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් දැනුම් දෙන ලද්දේ කෙටි කාලීන බදු පදනම මත වාර්ෂිකව රු.12,772,000 ක බදු මුදලකට ලබා දීමට හැකි බවයි. ඒ සඳහා ජල සම්පත් මණ්ඩලය එකඟව නොමැති අතර බදු ගිවිසුමකට එළඹී නොමැත. බදු මුදල් නොගෙවීම නිසා ඉඩමෙන් අස්කිරීම සඳහා කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරනු ලැබූ අතර උසාවිය මඟින් ඉවත් කිරීමේ නියෝග ලබා දෙන ලදී. මෙගා පොලිස් වැඩ පිළිවෙල යටතේ නාගරික සංවර්ධන අධිකාරිය ඉඩම, ඉඩම් කොමසාරිස් ජනරාල්ගෙන් නාගරික සංවර්ධන අධිකාරියට පවරා ගෙන මණ්ඩලයට පර්චස් 40ක ඉඩමක් බත්තරමුල්ලෙන් ලබා දෙන ලදී. කෙසේ වුවද අග්‍රාමාත්‍ය | සභාපතිවරයා හා අධ්‍යක්ෂ මණ්ඩලය සිය කාර්යභාරය හා වගකීම පිළිබඳ නිසි සැලකිල්ලකින් තොරව හා විධිමත් අධිකාරී බලයකින් තොරව ප්‍රධාන කාර්යාල පරිශ්‍රයෙන් ඉවත් වීමට ගෙන ඇති තීරණය පිළිබඳ මුදල් අමාත්‍යවරයා දැනුවත් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. 2013 සිට නොගෙවන ලද බදු ගෙවීමට සිදුවිය හැකි බැවින් ඒමත අසම්භාව්‍ය බැරකමක් පවතී. ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පරිදි කටයුතු නොකර අවුරුදු 45 ක් පමණ මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන ගිය පරිශ්‍රයෙන් ඉවත්ව 2021 ජූලි 18 දින සිට ප්‍රධාන කාර්යාලය නාවල කොස්වත්ත ප්‍රදේශයේ පෞද්ගලික කුලී ගොඩනැගිල්ලකට ගෙන ගොස් තිබුණි. එසේ වුවද අදාළ නඩුව අවසන්ව හෝ ප්‍රාදේශීය ලේකම් විසින් ඉවත් කරගෙන නොමැති බැවින් ඒ පිළිබඳව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 8 හි 100 ඡේදය ප්‍රකාරව මූල්‍ය වාර්තා වල හෙළිදරව් කළ යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි. | ලේකම්ගේ දැනුම් දීම මත එම ඉඩම අග්‍රාමාත්‍ය නිල නිවාසය සඳහා අත්පත් කර ගන්නා ලද අතර මාසික ගොඩනැගිලි කුලිය සඳහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලබා දෙන බැවින් මණ්ඩලයට ඉඩමෙන් ඉවත් වී ප්‍රධාන කාර්යාලය වෙනත් ගොඩනැගිල්ලකට ගෙනයන ලෙස දැනුම් දෙන ලදී. ඒ අනුව තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අදාළ නඩුව ඉදිරියට පවත්වාගෙන නොයන තත්වයක් මත බැරකමක් නොපවතින බැවින් ඒ සඳහා මූල්‍ය ප්‍රතිපාදනයක් අවශ්‍ය නොවේ. තවද මණ්ඩලය මඟින් ඉදිරිපත් කරන ලද අවසාන ගිණුම් වාර්තාවේ සටහන් අංක 15 මඟින් මෙම කරුණ පිළිබඳ ප්‍රමිති අංක 08 ට අදාළව අදාළ පැහැදිලි කිරීම් සිදු කර ඇත. | |
| (ආ) | 2016 වර්ෂයේදී රු.217,242,201ක් ලෙස ප්‍රත්‍යාගණනය කර තිබුණු යන්ත්‍ර උපකරණ, රසායනාගාර උපකරණ සහ පරිගණක යනාදී වත්කම් පන්තීන් 3 කට අදාළ අයිතම 537 ක ඵලදායී ජීවිත කාලය අවසන් වීම හේතුවෙන් පොත් අගය ශුන්‍ය වී තිබුණු අතර එම වත්කම් සම්බන්ධව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 හි 65 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. එම වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්වලට නොගැනීම හේතුවෙන් ඒවා සමාලෝචිත වර්ෂය තුළ භාවිතා කර තිබුණද ඒ සඳහා ක්ෂය ප්‍රතිපාදනය කර නොතිබුණි. | 2023 වර්ෂයේ නිවැරදි කරනු ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව අගය ශුන්‍ය වත්කම් වල ඵලදායි ජීවිත කාලය නැවත සමාලෝචනය කර ගිණුම්ගත කිරීමට හා ක්ෂය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) මණ්ඩලය විසින් නළ ළිං ඉදිකරන බාහිර ආයතන හා ඒවායේ භූ විදුම් යන්ත්‍ර සහ භූ ජල විද්‍යාඥයින් ලියාපදිංචිය 2018 වර්ෂයේ සිට සිදුකර තිබුණි. මීට අදාළව සමාලෝචිත වර්ෂයේ රු.3,218,000 ක හා රු.329,000 ක ආදායම් ගිණුම්ගත කර තිබුණි. ඒ පිළිබඳ පහත නිරීක්ෂණ සිදු කෙරේ. | | |
| (i) උක්ත පරිදි මණ්ඩලය භූ ජල විද්‍යාඥයින් ලියාපදිංචි කර තිබුණද ඒ සඳහා මණ්ඩලයට කිසිදු නෛතික ප්‍රතිපාදනයක් ලැබී නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | නෛතික ප්‍රතිපාදන සලසා ඇති ක්‍රියාකාරකම් පමණක් සිදු කළ යුතුය. |
| (ii) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 10හි 14ඡේදයට පටහැනිව උක්ත ලියාපදිංචි කිරීමේ හා ලියාපදිංචි අලුත් කිරීමේ ආදායම මුදල් පදනම මත හඳුනාගෙන තිබුණි. තවද ප්‍රමිතියේ 39(අ) ඡේදය ප්‍රකාර මෙම ආදායම් හඳුනාගැනීමට යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය වාර්තාවල හෙළිදරව් කර නොතිබුණි. | 2023 වසරේ නිවැරදි කරනු ඇත. | ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනීමටත් ප්‍රමිතියේ 39(අ) ඡේදය ප්‍රකාර මෙම ආදායම් හඳුනාගැනීමට යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය වාර්තාවල හෙළිදරව් කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ඈ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඉකුත් වර්ෂයේ මෙහෙයුම් ආදායම සඳහා වූ සංසන්දනාත්මක අගය රු.6,896,000කින් ගළපා නැවත ප්‍රකාශ කර තිබූ අතර ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ | 2021 වර්ෂයට අදාළ ගෙවීම් 2022 වසරේ සිදුකර ඇති බැවින් මෙම ගැලපීම කර ඇත. කෙසේ වුවද 2023 වසරේ සිට උපචිත පදනම මත ගිණුම් පිළියෙල කිරීමේදී මෙම කරුණු වලක්වා ගැනීමට හැකි වනු ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව නැවත ප්‍රකාශිත අගය සඳහා හෙළිදරව් කළ යුතු තොරතුරු, හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගිණුම්කරණ ප්‍රමිති 3 හි 54 ඡේදයේ(අ) සිට (ඇ) දක්වා වූ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | | |
| (ඉ) | වාරිමාර්ග අමාත්‍යාංශ වැය විෂයය අංක 198-2-03-23-2507-17 යටතේ 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ යූරෝ 20,629,921ක් හෙවත් රු.5,521,329,000ක පිරිවැයක් දරා ක්‍රියාත්මක කර තිබෙන භූගත ජල විමංසන තොරතුරු ජාලයක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය 2022 දෙසැම්බර් 31 දිනට අවසන් කර තිබුණි. ව්‍යාපෘතියට අදාළව කොන්ත්‍රාත්කරු විසින් මෙරටට ආනයනය කරන ලද යන්ත්‍ර උපකරණ, වාහන, අමතර කොටස්, මෙවලම් හා අමුද්‍රව්‍යවලින් රු.1,581,619,000 ක් වටිනා ලිබඩු උපකරණ, යන්ත්‍ර, මෝටර් වාහන, විද්‍යාත්මක උපකරණ හා පරිඝණක වැනි ජංගම නොවන වත්කම් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් මණ්ඩලය වෙත ලබා දී තිබුණි. හුවමාරු නොවන ගනුදෙනු ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 11 හි 49 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස හඳුනාගත යුතුව තිබුණු උක්ත ජංගම නොවන වත්කම්වල වටිනාකම විලම්බිත ආදායමක් ලෙස | පිළිගනිමි. 2023 වර්ෂයේ නිවැරදි කරමි. | හුවමාරු නොවන ගනුදෙනු අදාළ වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි. | | |
| (ඊ) | වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ රු.5,521,329,000 ක් වැය කර ක්‍රියාත්මක වූ ඉහත (ඉ) ඡේදය යටතේ දැක්වෙන භූගත ජල විමංසන තොරතුරු ජාලයක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය යටතේ මණ්ඩලය වෙත භාරදී තිබූ වත්කම්වලට අමතරව දරා තිබුණු රු.3,939,710,000ක පිරිවැයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් නියෝජනය කරන අධිතාක්ෂණික උපකරණ සහිත නළ ලිං 190ක් අදාළ නඩත්තු උපකරණ සමඟ මණ්ඩලයට පවරා ගෙන මෙම නළලිං 190හි වටිනාකම නිසිපරිදි හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කළ යුතු වුවද එසේ සිදුකර නොතිබුණි. | පිළිගනිමි. 2023 වර්ෂයේ නිවැරදි කරමි. | නළ ලිං හා අදාළ උපකරණ අමාත්‍යාංශයෙන් පවරාගෙන එවායේ වටිනාකම හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |
| (උ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 14 හි 34 ඡේදය ප්‍රකාරව සම්බන්ධිත පාර්ශවයන් වෙත ගෙවන ලද පාරිශ්‍රමික හා අනෙකුත් දීමනා පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවත්, මණ්ඩලයේ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ එම තොරතුරු හෙළිදරව් කර හෝ සම්බන්ධිත පාර්ශව සමඟ ගනුදෙනු සිදු නොවුණු බවට මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි. | සම්බන්ධිත පාර්ශ්වයන් වෙනුවෙන් ගෙවන ලද දීමනා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 04 – 1 යටතේ අධ්‍යක්ෂ මණ්ඩල ගාස්තු ලෙසින් දක්වා ඇති අතර ඊට අමතරව ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අංක 09 යටතේ මේ පිළිබඳව හෙළිදරව් කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 14 හි 34 ඡේදයේ සඳහන් පරිදි ප්‍රධාන කළමනාරණ කාර්ය මණ්ඩලයට අදාල තොරතුරු හෙළිදරවු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂයට අදාළ ආදායම හඳුනාගෙන උපචිත පදනම මත ගිණුම් තැබීම වෙනුවට මෙහෙයුම් ආදායම් වලට අදාළ ඉකුත් වර්ෂවල අගයන් පසු වර්ෂයේ නැවත ප්‍රකාශ කර අලාභයට ගැළපීම සිදු කර තිබුණි. ඒ අනුව 2020 හා 2021 වර්ෂවල පිළිවෙලින් රු. 12,593,000 ක් හා රු. 23,910,000 ක් වූ අලාභය පසු වර්ෂවල රු. 10,973,000 හා රු. 16,988,000 ක් වශයෙන් සියයට 12.9 කින් හා සියයට 28.9 කින් අඩු වී තිබුණි. | පිළිගනිමි. 2023 වර්ෂයේ නිවැරදි කරමි. | උපචිත පදනම මත ආදායම්, වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය |
| (ආ) | ඉකුත් වර්ෂවල භාණ්ඩාගාර හා වෙනත් ප්‍රදානයන් යටතේ ලැබී තිබුණු රු.334,244,000 ක් වූ වත්කම් 2021 දෙසැම්බර් 31 දිනට විලම්බිත ආදායමක් ලෙස දක්වා තිබුණු අතර අදාළ වටිනාකම් ඉකුත් වර්ෂවල ආදායම් ලෙස හඳුනාගත යුතු වුවද එසේ නොකර තවදුරටත් විලම්බිත ආදායමක් ලෙස දක්වා තිබුණි. | පිළිගනිමි. 2023 වර්ෂයේ නිවැරදි කරමි. | ප්‍රදාන ලැබුණු වර්ෂයේ ආදායම් ලෙස හඳුනාගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස හඳුනා ගත යුතු උක්ත වත්කම්වලට අදාළ ක්‍රමක්ෂය රු.119,050,000 ක් ක්‍රමක්ෂය ගිණුමට බැර කිරීම වෙනුවට ස්ථාවර වත්කම් ක්ෂය ගිණුමට බැර කර තිබුණි. | පිළිගනිමි. 2023 වර්ෂයේ නිවැරදි කරමි. | ක්‍රමක්ෂය ආදායම හා ක්ෂය වියදම නිවැරදිව ගිණුම් තැබිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට නළලිං ඉදිකිරීමේ සේවා අත්තිකාරම් ගිණුමේ රු.15,919,957 ක ශේෂයක් වූ අතර ඉන් රු.898,205 කට අදාළ සේවාවන් සමාලෝචිත වර්ෂය තුළ ඉටුකර තිබුණද, එම අගය වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | වාර්තා ලැබීම ප්‍රමාද වීම, ලිපිගොනු අස්ථානගත වී තිබීම වැනි කරුණු නිසා සමාලෝචිත වර්ෂය අවසානයේ රු.898,205 ක මුදලක් ඉන්වොයිස් ගත කිරීමට නොහැකි විය. | වර්ෂයට අදාළ ආදායම නිවැරදිව හඳුනා ගෙන උපචිත පදනම මත ගිණුම්ගත කළ යුතුය. නළලිං ඉදිකිරීමේ සේවා අත්තිකාරම් ගිණුමේ පවතින ශේෂය නොපමාව නිරවුල් කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) 1964 අංක 29 දරන ජල සම්පත් මණ්ඩල පනතේ 16 වන වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් 2017 මාර්තු 16 දිනැති අංක 2010/23 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කළ නියෝග. | | | | |
| (i) | 02 නියෝගය | නළ ලිං ඉදිකිරීමේ නියැලෙන සියලු ආයතන මණ්ඩලයේ ලියාපදිංචි විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ආයතන 72ක් පමණක් මණ්ඩලයේ ලියාපදිංචි වී තිබුණු අතර ලියාපදිංචි වී නොමැති ආයතන මොනවාද යන්න හඳුනා ගැනීම සඳහා ප්‍රමාණවත් වැඩපිළිවෙලක් මණ්ඩලය සතුව නොතිබුණි. තවද ඉහත නියෝගය පරිදි ලියාපදිංචි ආයතන විසින් නව ඉදිකිරීම් කරනු ලබන සියලු නළ ලිංවල දත්තයන් ඇතුළත් වාර්තාවක් සෑම මාස 03 කට වරක් මණ්ඩලය වෙත ලබා දිය යුතු වුවත් ලියාපදිංචි ආයතන 72 කින් උක්ත වාර්තාව ලබා දී තිබුණේ ආයතන 3 ක් පමණි. | 2021 වර්ෂයේ නොවැම්බර් මස ජල සම්පත් මණ්ඩලයේ මේ දක්වා ලියාපදිංචි වී ඇති සියලුම විදුම් ආයතන වෙත 2022 වර්ෂය සඳහා ලියාපදිංචි වන ලෙස ලිඛිතව දැනුම් දෙන ලදී. නමුත් 2022 වර්ෂය සඳහා බාහිර විදුම් ආයතන හා විදුම් යන්ත්‍ර 72 ක් ලියාපදිංචි විය. නැවත සියලුම විදුම් ආයතන දැනුවත් කර ලියාපදිංචිය යාවත්කාලීන කරන ලෙස ද දැනුම් දෙන ලදි. | ලියාපදිංචි නොවූ ආයතන හඳුනාගැනීමට හා ලියාපදිංචි කර ගැනීමට කටයුතු කළ යුතුය. නළළිං වල දත්ත වාර්තා ලබා නොදෙන ආයතන සම්බන්ධව නීත්‍යානුකූලව කටයුතු කළ යුතුය |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 03 නියෝගය | ජලය බෝතල් කිරීමේ කර්මාන්තයෙහි හා බීම නිෂ්පාදනයෙහි නියැලෙන ආයතනයක් හෝ පුද්ගලයෙකු ස්වභාවික ජල උල්පතක් හෝ භූගත ජලය සිය නිෂ්පාදන කටයුතු සඳහා උපයෝගී කරගනු ලබන්නේ නම් සෑම මාස 6කට වරක්ම එකී ජල මූලාශ්‍රයේ ජල නියැදියක් රජයේ පිළිගත් රසායනාගාරයකින් පරීක්ෂා කරවාගෙන අදාළ විශ්ලේෂණ වාර්තාව අනුමැතිය සඳහා මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති ආයතන 40 කින් සමාලෝචිත වර්ෂයේ අවසාන වන විට ඉහත වාර්තා ලබා දී තිබුණේ එක් ආයතනයක් පමණි. | ජලය බෝතල් කිරීමේ කර්මාන්තයේ සහ බීම නිෂ්පාදනයෙහි නියැලෙන ආයතන 31ක් පමණක් මේ වන තෙක් අදාළ ජල ප්‍රභවයෙහි ගුණාත්මකභාවය පිළිබඳ වාර්තා මණ්ඩලය වෙත ලබා දී ඇත. 2022 වර්ෂයේ එක් ආයතනයක් පමණක් අදාළ වාර්තා ලබාදී ඇත. එබැවින් ලියාපදිංචි සියලුම ආයතන වෙත අදාළ තොරතුරු ලබාදෙන ලෙස ලිඛිතව දන්වා ඇති අතර වාර්තා ඉදිරිපත් නොකළ ආයතන සඳහා අවශ්‍ය නීතිමය පියවර ගැනීමට කටයුතු කරමින් පවතියි. | නිශ්චිත කාලයක් තුළ අදාළ වාර්තා ලබා ගැනීමට කටයුතු කළ යුතු අතර වාර්තා ලබා නොදුන් ආයතන වලට එරෙහිව නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (iii) | 06 නියෝගය | ස්වභාවික ජල උල්පත් හෝ ගැඹුරු හෝ නොගැඹුරු භූගත ජලය භාවිතා කරන රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතන විසින් අනුගමනය කළ යුතු නියමයන් ඇතුළත් 1 සිට 5 දක්වා නියෝග ප්‍රකාරව කටයුතු නොකරන සංවිධාන හෝ පුද්ගලයන්ට එරෙහිව 1999 අංක 42 දරන පනතින් සංශෝධිත 1964 අංක 29 දරන ජල සම්පත් මණ්ඩල පනතේ 20 වන වගන්තිය ප්‍රකාරව නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි. | වාණිජ අරමුණු සඳහා භාවිතා කරනු ලබන භූගත ජල ප්‍රභවයන්හි ජලයේ ගුණාත්මකභාවය පිළිබඳ වාර්තා මණ්ඩලය වෙත ලබා දී නොමැති හඳුනාගත් ආයතන සඳහා නීතිමය පියවර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | නියෝග ප්‍රකාරව කටයුතු නොකරන ආයතන සම්බන්ධව නීත්‍යානුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | 1981 අංක 26 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධිත) පනතේ 10 හා 11 වගන්ති | අරමුදල සඳහා සේව්‍ය දායකත්වය සියයට 12ක් හා සේවක දායකත්වය සියයට 8ක් විය යුතු අතර ඊට වැඩි අනුපාතයකට එකඟ විය හැක. එසේ වුවද, මණ්ඩලයේ සේව්‍ය දායකත්වය සියයට 12 ක් වීමේදී සේවකයන්ගෙන් සියයට 10 ක් අයකර ගෙවා තිබුණද ඒ සම්බන්ධයෙන් කොමසාරිස්වරයා වෙත දැනුම් දී නොතිබුණි. | ජල සම්පත් මණ්ඩලය විසින් 1981 ජූලි මස සිට මේ දක්වා සේවක අර්ථසාධක අරමුදලට සේවක දායකත්වය සියයට 10ක් හා මණ්ඩලයේ දායකත්වය සියයට 12 ක් ලෙස දායක මුදල් බැර කිරීමට කටයුතු කර ඇත. සේවක දායකත්වය සියයට 10ක් වීම සේවකයන්ට ඉතිරියක් බැවින් මේ | 1981 අංක 26 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධිත) පනතේ සඳහන් අනුපාතයන්ට වැඩි අනුපාතයකින් දායක මුදල් ගෙවීම සඳහා සේව්‍ය සේවක දෙපාර්ශවයේ |

| | | | | |
|---|---|---|---|---|
| | | | දක්වා සේවකයන්ගෙන් විරෝධතාවයක් පැන නැඟී නොමැත. | ලිඛිත එකඟතාවය ලබා ගෙන කොමසාරිස්වරයා වෙත දැන්විය යුතුය. |
| (ඇ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වා දෙන ලද රාජ්‍ය ව්‍යවසායන්හි සංයුක්ත පාලනය සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ | | | |
| (i) | 2.2.1 | මණ්ඩලය සඳහා ප්‍රධාන කාර්යසාධන දර්ශක නිශ්චය කර හෝ සංයුක්ත සැලැස්මක් සකස් කර හෝ ඒ අනුව මණ්ඩලය මෙහෙයවීමට කටයුතු කර හෝ නොතිබුණි. | සටහන් කර ගෙන ඇත. | මාර්ගෝපදේශයට අනුකූලව සංයුක්ත සැලැස්මක් සකස් කර ඒ අනුව මණ්ඩලය මෙහෙයවීමට කටයුතු කළ යුතුය. |
| (ii) | 2.2.2 (ආ) | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට පෙර අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා කියවා අධ්‍යනය කිරීම සඳහා මණ්ඩල සාමාජිකයින් වෙත ඉදිරිපත් කිරීම, තීරණ ගැනීමට හා වගවීම තහවුරු කිරීමට අවශ්‍ය මනා විශ්වාසදායී කළමනාකරණ තොරතුරු පද්ධතියක් පවත්වාගැනීම, විගණන කමිටු ඇතුළු අනෙකුත් උප කමිටුවල තීරණ කාලීනව පසු විපරම් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම හා සම්බන්ධිත පාර්ශ්වයන්ගේ අවශ්‍යතා ඉටුවන, මූල්‍ය හා මූල්‍ය නොවන උපරිම තොරතුරු පරිශීලන හිතකාමී පරිදි මණ්ඩලයේ වෙබ් පිටුව මගින් හෙළිදරව් කිරීම යන අවශ්‍යතා ඉටුවන පරිදි ශක්තිමත් පාලන රාමුවක් ස්ථාපිත කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කර නොතිබුණි. | මේ සඳහා විශේෂිත දැනුම හා අත්දැකීම් ඇති නිලධාරීන් පත්කිරීමට අවශ්‍ය වුවත් තනතුරු ඇති කිරීමට ලේකම්වරයාගෙන්ද ඉල්ලීම් කලද එය අනුමත නොවූ අතර දැනට කළමනාකරණ සහකාර වරයෙකු පත් කොට ඇත. | මාර්ගෝපදේශ මගින් නියම කර ඇති නිර්ණායකයන්ට අනුකූලව මණ්ඩලයේ කටයුතු මෙහෙයවන බවට හා ශක්තිමත් පාලන රාමුවක් ස්ථාපිත කරනු ලබන බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | 2.2.3 | අවදානම් කළමනාකරණය හා මණ්ඩලයේ අභ්‍යන්තර පාලන පද්ධතීන්ගේ ප්‍රමාණවත්භාවය හා සඵලදායී ක්‍රියාකාරීත්වය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රමාණවත් අවධානයට ලක් වී නොතිබුණි. | සටහන් කර ගෙන ඇත. | අවදානම් කළමනාකරණය හා අභ්‍යන්තර පාලන පද්ධතීන් සඵලදායීව ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කළ යුතුය. |
| (iv) | 2.4 | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මණ්ඩලය සමඟ වූ සම්බන්ධතා පිළිබඳ මණ්ඩලයේ ලේකම් වෙත වාර්ෂික ප්‍රකාශයක් සිදුකර නොතිබුණු අතර මණ්ඩලයේ වාර්ෂික වාර්තාවේ එක් එක් අධ්‍යක්ෂවරයා සම්බන්ධයෙන් අදාළ හෙළිදරව් කිරීම් ද සිදුකර නොතිබුණි. | 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාවේ ඇතුලත් කර ගැනීමට සටහන් කර ගෙන ඇත. | අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් ප්‍රකාශ ලබා ගැනීමට හා අධ්‍යක්ෂවරුන් පිළිබඳ තොරතුරු වාර්ෂික වාර්තාවේ දැක්වීමට කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.27,506,000ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.16,988,000ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.10,518,000ක ඌනතාවයේ වැඩිවීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ආදායම රු.33,084,000කින් වැඩි වී තිබුණද වැටුප් හා වේතන රු.24,453,000කින් හා සැපයුම් වියදම් රු. 21,513,000කින් වැඩිවීම මෙම ඌනතාවයේ වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 හඳුනාගත් පාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උතුරුමැද පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සංවර්ධන ව්‍යාපෘති යටතේ කුරුලුනිකවැව හා මානේරුව පේෂකර්ම මධ්‍යස්ථානයන්හි නළළිං 2ක් ඉදිකිරීමට රු. 467,500 ක් 2021 වර්ෂයේ මණ්ඩලයට ලබා දී තිබුණි. එම වර්ෂය තුළ නලළිං ඉදිකර නොතිබුණු අතර 2023 වර්ෂයේ දී එම නලළිං ඉදිකිරීමේදී උක්ත ගෙවූ මුදල | වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඇති අතර එම නිලධාරීන්ට එරෙහිව විනයානුකූල කටයුතු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. | නියමිත දිනට නළ ළිං ඉදිකර නොදීම හේතුවෙන් සිදුව ඇති අලාභය වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීම සඳහා ඔවුන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඉක්මවා රු.280,219 ක් වැය කිරීමට සිදුවී තිබුණි. මේ සම්බන්ධව අදාළ ගනුදෙනුකරුගේ පැමිණිල්ල මත පාරිභෝගික සේවා අධිකාරිය විසින් පැරණි ඇස්තමේන්තුව යටතේ අදාළ නලළිං ඉදිකර දියයුතු බවට කර තිබුණු නියෝගයට අනුව අදාළ නලළිං අතිරේක ගාස්තු අය කිරීමකින් තොරව නිමකර තිබුණි. මෙහිදී සේවා ගිවිසුම් අනුව නියමිත දිනට නලළිං ඉදි කර නොදීම හේතුවෙන් දැරීමට සිදු වූ අමතර පිරිවැය රු.280,219 ක මුදල වගකිවයුතු පාර්ශ්වයන්ගෙන් අයකරගත යුතු බවට 2022 දෙසැම්බර් 25 දිනැති අංක 1430 දරන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණද අදාළ මුදල් මේ දක්වා අයකර ගැනීමට හා ඊට වගකිවයුතු සහකාර විදුම් අධිකාරීවරයාට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීමට පියවර ගෙන නොතිබුණි. | | |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජල සම්පත් මණ්ඩල පනත සංශෝධනය කිරීමට අදාළ කෙටුම්පතක් පිළියෙල කිරීම සඳහා පෞද්ගලික නීතිඥයෙකු හා නීතිඥ සමාගමක සේවය ලබාගෙන විගණිත දිනය වූ 2023 ජුලි 31 වන විට රු. 620,000 ක් ගෙවා තිබුණු අතර පනත සංශෝධනය කළ යුතු බවට හඳුනාගෙන වසර 4 ක් ගතවූ පසුවද එම කාර්යය ඉටුකර නොතිබුණි. | 2017 සකස් කරන ලද කෙටුම්පත තවදුරටත් වර්ධනය කරමින් 2022 දි ඇති වූ වෙනත් ප්‍රවණතා සැලකිල්ලට ගෙන නව නීතිඥ සමාගමක් මගින් සංශෝධනය අවසන් කර ඇත. කෙටුම්පත සකස් කර ගරු ඇමතිතුමාට ඉදිරිපත් කර ඇති අතර එහිදී මතු වූ සංශෝධනයන් සිදු කර නැවත ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. | පනත සංශෝධනය කිරීමේ කටයුතු කඩිනම් කළ යුතුය. |
| (ආ) | මණ්ඩලය විසින් සිදුකරන විදුම් කටයුතු, ජලධාරිතා පරීක්ෂණ හා සාමාන්‍ය වාහන | විදුම් යන්ත්‍ර,වායු පීඩන යන්ත්‍ර, ජෙනරේටර් හා කැබ්රථ යනාදියට ජී.පී.එස් උපාංග 30 | ඉන්ධන සංවේදක උපකරණ හා ජී.පී.එස්. පද්ධති සවි කිරීම |

| | | | |
|---|---|---|---|
| | ධාවනයේදී සිදුවන අධික ඉන්ධන භාවිතය තුළ වංචා ඇතිවීම වළක්වාගැනීමට පියවරක් ලෙස අදාළ යන්ත්‍ර උපකරණවල හා වාහනවල ඉන්ධන සංවේදක උපකරණ හා ජී.පී.එස්. පද්ධති සවි කිරීම සඳහා 2019 සැප්තැම්බර් 18 දින පුද්ගලික සමාගමක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. එහිදී විදුම් යන්ත්‍ර 7ක්, පොම්ප පද්ධති 2ක්, කaa කැබ් 1ක්, කැබ් රථ 12ක් හා කොම්ප්‍රෙසර් පද්ධති 8ක් සඳහා උක්ත උපකරණ සවි කිරීමට අපේක්ෂා කර තිබුණද වසර 3 1/2 කට අධික කාලයක් ගත වූ පසුවද විගණිත දින වූ 2023 මාර්තු 21 වන විට මෙම පද්ධති සම්පූර්ණ කර තිබුණේ කැබ්රථ 12 ක් සහ විදුම් යන්ත්‍ර 3ක් සඳහා පමණකි. | ක් සවිකිරීම නිම කරන ලද අතර කැබ්රථ හැර අනෙක් යන්ත්‍රෝපකරණ වලට ඉන්ධන යෙදීම වැඩබිම් වල බැරල් වලින් නිකුත් කරනු ලැබීම නිසා ගණනය කිරීමේ අපහසුතාවක් ඇතිවී තිබුණු අතර පසුව මැනුම් උපකරණ ලබා දී එම ගැටලුව විසඳන ලදී. 2020 හා 2021 වසර වල පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා ක්ෂේත්‍ර වලට යන්ත්‍රෝපකරණ යෙදවීම සීමා වීමත් හා යන්ත්‍රෝපකරණ වල හටගත් කාර්මික දෝෂයන් නිසාත් තොරතුරු වාර්තා යාවත්කාලින නොවිණි. පසුව පරික්ෂා කර ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක වන ඒකකයන්හි වාර්තා පරික්ෂා කර ඒවාට පමණක් ගෙවීමට කටයුතු කර ඇත. | නොපමාව නිම කළ යුතුය. |
| (ඇ) | නාගරික සංවර්ධන අධිකාරියට අයත් බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ පිහිටි පර්චස් 40 කින් යුත් ඉඩමක් 2016 දෙසැම්බර් 06 දිනැති අංක අමප/16/2500/724/099 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් වර්ෂ 30 ක කාල සීමාවක් සඳහා ජල සම්පත් මණ්ඩලය වෙත ලබාදීමට තීරණය කර තිබුණි. මණ්ඩලයේ නව ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමට යෝජිත එකී ඉඩම සඳහා රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් වාර්ෂිකව රු. 2,700,000 ක බදු මුදලක් තීරණය කර තිබුණි. නාගරික සංවර්ධන අධිකාරිය සමඟ බදු ගිවිසුමක් අත්සන් නොකර මණ්ඩලය විසින් 2016 වර්ෂයේ සිට 2023 මාර්තු | බත්තරමුල්ලේ පිහිටි පර්චස් 40ක ඉඩම මණ්ඩලයට ලබා දීමට නාගරික සංවර්ධන අධිකාරිය තීරණය කලේ හෙක්ටර් කොබ්බෑකඩුව මාවතේ ඉඩමෙන් ඉවත්වන ලෙසට කරන ලද නියෝගයට ප්‍රතිචාර වශයෙනි. ඉඩම මණ්ඩලයට ලබා දුන්නේ 2015 දී වන අතර එතැන් සිටම මෙම ඉඩමේ නෙදර්ලන්ත ව්‍යාපෘතිය යටතේ ගොඩනැගිල්ල ඉදිකිරීමට එවකට සිටි සභාපතිවරුන් ක්‍රියාකර තිබුනද නාගරික සංවර්ධන අධිකාරිය මෙම ඉඩමේ භෞතික සන්තකය පමණක් ලබාදුණි. එම ඉඩම මණ්ඩලයට අයත් බව කියමින් දිගටම මුදල් අයකර ගනු ලැබුවද ඉඩම් පනතේ 6 (1) වගන්තිය අනුව ඉඩම නිදහස් කර නැති නිසා බදු | බදු ගිවිසුමකට එළඹීමට පෙර මුදල් ගෙවීමට කටයුතු කිරීම හා එම වියදමෙන් කිසිදු ප්‍රතිලාභයක් නොලැබීම හේතුවෙන් සිදුකර ඇති අලාභය සඳහා වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| දක්වා කුලිය වශයෙන් රු.23,344,253 ක් එම අධිකාරියට ගෙවා තිබුණි. මෙම ඉඩමේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2018 වර්ෂයේ සිට භූගත ජල විමංසන තොරතුරු ජාලයක් ස්ථාපිත කිරීම සඳහා වූ නියමු ව්‍යාපෘතිය යටතේ ප්‍රතිපාදන වෙන්වී තිබුණද විධිමත් බදු ගිවිසුමක් නොමැති වීම හේතුවෙන් එය උපයෝජනය කර නොතිබුණි. | ගිවිසුම අත්සන් කිරීම පමා කරන ලදී. දැනට ඉඩම් කොමසාරිස් විසින් එම අනුමැතිය දීමට ආසන්නව ඇත. බදු ගිවිසුමක් නොමැතිවීම නිසා ගොඩනැගිල්ල ඉදි කිරීම ප්‍රමාද විය. දැනට මෙම ඉඩම අවුරුද්දක කාලයකට රු.500,000 ක මාසික අතුරු බද්දකට විදේශ සේවා කාර්යංශයට ලබා දීමට එකඟව ඇත. | |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලයේ විදුම් අංශයට විදුම් කළමණාකරුවකු, විදුම් නිලධාරීන් 11 දෙනෙකු ඇතුළු 68 දෙනෙකුගෙන් යුත් සහාය කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර තිබුණු අතර එම කාර්ය මණ්ඩලය සඳහා වැටුප්, අතිකාල, ගමන් වියදම් හා අනෙකුත් පිරිවැය වශයෙන් සමාලෝචිත වර්ෂය තුළ රු 41,478,196ක පිරිවැයක් දරා තිබුණි. එම අංශය සතු විදුම් යන්ත්‍ර 16 ක් අතරින් 8ක් පමණක් ක්‍රියාකාරී තත්ත්වයේ පැවතුණු අතර අංශය විසින් 2016 වර්ෂයේ නලළිං 437 ක් ඉදි කර තිබුණද සමාලෝචිත වර්ෂය වන විට එය නලළිං 79 ක් දක්වා අඛණ්ඩව පහළ ගොස් තිබුණි. අංශයේ මෙහෙයුම් අකාර්යක්ෂමතාවය, මණ්ඩලය විසින් ඉදිකරනු ලබන නළළිං වල ප්‍රමිතිය හා කාර්යක්ෂමතාව පිළිබඳ සමාජය තුළ පැවති කීර්තිනාමය අඛණ්ඩව පිරිහීම ඊට හේතු වී තිබුණද ඒ පිළිබඳ විශ්ලේෂණයක් සිදු කර | රු.20,647,630ක වටිනාකමකින් යුත් නළ ළිං 79ක කටයුතු පමණක් සමාලෝචිත වර්ෂය තුළ අවසන්කර තිබුණි. 2022 වර්ෂයේ පැවති කොවිඩ් වසංගත බලපෑම සහ ඉන්ධන ලබාගැනීමේ අපහසුතා මෙන්ම ඉන්ධන මිල ඉක්මනින් වෙනස් වීම හේතු කොට ගෙන නළ ළිං ඉදිකිරීමේ කටයුතු වලට බාධා පැමිණ තිබුණි. | විදුම් අංශය සඳහා වෙන් කර ඇති සම්පත් උපරිම කාර්යක්ෂමතාවයෙන් උපයෝජනය කරගැනීමටත් ගුණාත්මක හා කාර්යක්ෂම සේවා සැපයීම සඳහා අවශ්‍ය නිවැරදි කිරීම් ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අවශ්‍ය නිවැරදි කිරීම් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | |
| (ආ) | නලළිං ඉදිකිරිමේ සේවා අත්තිකාරම් ගිණුමේ සමාලෝචිත වර්ෂය අවසානයට රු.15,919,957ක ශේෂයක් පැවතුණු අතර ඒ තුළ වර්ෂයකට වඩා පැරණි අදාළ කාර්ය නිමකර නොතිබුණු රු.1,637,828ක් වූ අත්තිකාරම් ශේෂයක් විය. අදාළ සේවා නොසැපයීම හේතුවෙන් මණ්ඩලය විසින් ලබාගත් අත්තිකාරම් රු.2,310,356ක් ආපසු ගෙවා තිබුණු අතර ඒ තුළ නලළිං 4 ක් ඉදිකිරීම අසාර්ථක වීම හේතුවෙන් ආපසු ගෙවීමට සිදු වූ රු. 883,055ක්ද විය. | ලබාගත් රු. 2,310,356 ක මුදල නැවත ගෙවීමට සිදුවූයේ ගෙවූ පාර්ශ්වය විසින් අවශ්‍ය සහාය නොදැක්වීම, වැඩිපුර ගෙවීම්, ජනතා විරෝධය හා බැර ලෝහ පරීක්ෂා කරන උපකරණ ක්‍රියාවිරහිත වීම යන හේතු නිසාය.<br>ඉහත මුදලින් රු. 409,709 ක් අය කර ගෙන සේවා අත්තිකාරම් ගිණුම නිරවුල් කිරීමට කටයුතු කර ඇත. ඉතිරි රු.1,900,646 ක මුදල නිරවුල් කිරීමට කටයුතු කරමින් සිටී.<br>අසාර්ථක නලළිං 4 ක් ඉදිකිරීම නිසා මණ්ඩලයට වැයවූ මුදල රු. 883,055 ක් වුවද අසාර්ථක නලළිං 04 ඉදිකිරිම වෙනුවෙන් මණ්ඩලයට අය කරගත් මුදල රු.1,407,415 කි. ඒ අනුව මණ්ඩලය විසින් රු.524,360 ක ලාභයක් උපයාගෙන ඇත. | මණ්ඩලය විසින් භාරගත් කාර්යභාරය නියමිත වේලාවට ඉටු කළ යුතුය. සාර්ථක අයුරින් නලළිං ඉදිකිරීමේ වගකීම මණ්ඩලය භාරගත යුතු බැවින් අසාර්ථක නලළිං ඉදිකිරීමට කටයුතු කළ නිලධාරීන්ට එරෙහිව විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකාවේ භූගත ජලයේ පවතින ප්‍රමාණාත්මක හා ගුණාත්මක තත්ත්වයන් කළමනාකරණය කිරිම සඳහා පද්ධතියක් ස්ථාපනය කිරීමට, ශ්‍රී ලංකාව සඳහා භූගත ජල විමංසන ජාලයක් ස්ථාපිත කිරිමේ නියමු ව්‍යාපෘතිය වකුගඩු රෝගය විශාල වශයෙන් ව්‍යාප්ත වී ඇති අනුරාධපුරය, පොළොන්නරුව, මොණරාගල සහ පුත්තලම ලෙස තෝරා ගත් දිස්ත්‍රික්ක 4 ක ක්‍රියාත්මක කිරීම සඳහා | | |

2015 ජූලි 29 දිනැති අංක අමප/15/1087/644/005 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දී තිබුණි. එකී ව්‍යාපෘතිය යුරෝ 20,629,921ක පිරිවැයකට ක්‍රියාත්මක කිරීම සඳහා වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම් විසින් නෙදර්ලන්තයේ රෝයල් අයිකල්කැම්ප් ආයතනය සමඟ 2017 ඔක්තෝබර් 03 දින ගිවිසුමකට එළඹ තිබුණු අතර ව්‍යාපෘතියේ කටයුතු 2022 දෙසැම්බර් 31 දින අවසන් කර තිබුණි. මෙම ව්‍යාපෘතියේ පිරිවැය වූ යුරෝ 20,629,921.18 හෙවත් රුපියල් 5,521,329,000 න් සියයට 85 ක් එනම් යුරෝ 17,535,433 ක් නෙදර්ලන්තයේ රේබෝ බැංකුවෙන් (Rabo Bank) වාර්ෂිකව සියයට 1.45 බැගින් වූ සහන පොලී අනුපාතයක් මත වර්ෂ 10ක් තුළ සමාන වාරික 20 කින් ආපසු ගෙවීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ලබා ගෙන තිබුණි. ඉතිරි සියයට 15 වන යුරෝ 3,094,488.18 ක මුදල ශ්‍රී ලංකාවේ හැටන් නැෂනල් බැංකුව වෙතින්, වසර 3 ක සහන කාලයකින් පසු 2025 දෙවන අර්ධ වර්ෂයේ සිට වසර 15 කින් ගෙවීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ලබා ගෙන තිබුණි. ව්‍යාපෘති නිම කර තිබුණද එයට අදාළව පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

| | | | |
|---|---|---|---|
| (i) | නෙදර්ලන්ත රේබෝ බැංකුවෙන් ලබා ගෙන තිබුණු ණය මුදලින් රු.මිලියන 76.2 කට හෙවත් යුරෝ 433,288 කට අදාළ | ව්‍යාපෘති ණය මුදල් සහ ණය වාරික ගෙවීම විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් මහා භාණ්ඩාගාරය හරහා සිදු කෙරෙන අතර, මේ දක්වා | වැය නොකළ මුදල් ණය වාරිකවලින් අඩුකර ගෙවීමට භාණ්ඩාගාරය දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වැඩකටයුතු නෙදර්ලන්ත කොන්ත්‍රාත්කරු විසින් ඉටු කර නොතිබුණු අතර ණය ගිවිසුමෙහි 5.2 වගන්තිය අනුව සම්පූර්ණ ණය මුදල භාවිතයට නොගන්නේ නම් ඉතිරි වන මුදල ණය ආපසු ගෙවීමේ වාරික වලින් සමානුපාතිකව අඩු කරගත හැකි වුවත් ඉටු නොකළ කාර්යයන් පිළිබඳව මණ්ඩලය විසින් මහා භාණ්ඩාගාරය දැනුවත් කර නොතිබුණි. | ණය වාරික දෙකක් රේබෝ බැංකුව වෙත ගෙවා ඇත. ව්‍යාපෘති ගිවිසුම අනුව දත්ත මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදි කිරීමට නොහැකි වීම හේතුවෙන් වැය නොවූ මුදල පිළිබඳ ඉදිරි කටයුතු රේබෝ බැංකුව සමඟ එළඹ ඇති ණය ගිවිසුමෙහි 5.2 වගන්තිය පරිදි විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ඇත. ඒ අනුව සම්පූර්ණ ණය මුදල භාවිතයට නොගන්නේ නම් ඒ අනුව ඉතිරි වන මුදල ණය ආපසු ගෙවීමේ වාරික වලින් සමානුපාතිකව අඩු කරනු ඇත. | |
| (ii) | ව්‍යාපෘතිය යටතේ බත්තරමුල්ල නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩමේ දත්ත මධ්‍යස්ථාන ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු.මිලියන 259.1 ක් හෙවත් යුරෝ 1,473,462 ක් වෙන්කර තිබුණු අතර රු.මිලියන 329.8 ක් හෙවත් යුරෝ 1,875,447 ක අවිනිශ්චිත වෙන් කිරීම්ද දත්ත මධ්‍යස්ථානය සඳහා භාවිතා කිරීමට තීරණය කර තිබුණි. මෙකී මුළු වටිනාකමින් සියයට 15 ක් වූ රු.මිලියන 544.2 ක් හෙවත් යුරෝ 3,094,488 ක් අත්තිකාරම් ලෙස නෙදර්ලන්ත කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණු නමුත් ඉඩම් හිමිකාරීත්වය ලැබී නොතිබීම හේතුවෙන් දත්ත මධ්‍යස්ථානය ඉදි කර නොතිබුණි. මෙම දත්ත මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිනොකිරීම නිසා ව්‍යාපෘතියේ මූලික අරමුණු හා අපේක්ෂිත ප්‍රතිලාභ | ව්‍යාපෘති ගිවිසුම් අනුව දත්ත මධ්‍යස්ථානය සඳහා ජල සම්පත් මණ්ඩල කාර්යාලය පිහිටි හෙක්ටර් කොබ්බෑකඩුව මාවතේ වර්ග අඩි 6,000ක ගොඩනැගිල්ලක් ඉදිකල යුතු වුවද එම ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය මඟින් පවරා ගැනීම සහ ප්‍රධාන කාර්යාලයද ඇතුළුව දත්ත මධ්‍යස්ථානය වර්ග අඩි 24,000ක ප්‍රමාණයට ජල සම්පත් මණ්ඩලය මඟින් සැලසුම් කර ඇත. නාගරික සංවර්ධන අධිකාරියෙන් ලබාදුන් බත්තරමුල්ලේ පිහිටි ඉඩම සඳහා බදු ගිවිසුමක් ලබා නොදීම හේතුවෙන් මෙම ගොඩනැගිල්ල ඉදි කළ නොහැකි වුවද රත්මලාන වැඩබිම් කාර්යාලයෙහි (Workshop) දත්ත මධ්‍යස්ථානය ව්‍යාපෘති අරමුණු සහ අවශ්‍යතාවයන් පරිදි මේ වන විට ස්ථාපනය කර කටයුතු කරගෙන යනු ලබයි. | ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ප්‍රථම ගොඩනැගිල්ල ඉදිකිරීමට අවශ්‍ය මූලික කාර්යයන් ඉටු කරගෙන තිබිය යුතු වුවද ඒ අනුව කටයුතු නොකළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ වගකීම දරන මණ්ඩලයේ නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නිසිලෙස ලබාගත නොහැකි වී තිබුණි. | | |
| (iii) | කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව ජල විමංසන දත්ත පද්ධතිය වසර 05 ක් නඩත්තු කිරීම සඳහා අවශ්‍ය අමතර කොටස් කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතු වූ අතර ඒ සඳහා රු.මිලියන 106.5 ක් හෙවත් යුරෝ 605,894 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. මේ යටතේ කොන්ත්‍රාත්කරු අමතර කොටස් 160 ක් සපයා තිබුණු අතර ඒවා අතරින් රත්මලාන වැඩබිම් ගබඩාවේ තැන්පත් කර තිබුණු නඩත්තු උපකරණ අයිතම 41 ක් විධිමත්ව භාරගෙන ගිණුම්ගත කර නොතිබුණි. | කොන්ත්‍රාත්කරු විසින් සපයන ලද සියලුම භාණ්ඩ ලැයිස්තු ගත කර ගබඩාවට භාරදී ඇත. තවද BOQ අයිතම 34 යටතේ නිමාන කටයුතු සඳහා ස්ථාපිත කොට ඇති උපකරණයන් අවුරුදු 5කට නඩත්තු කිරීමට යන පිරිවැයද ඇතුළත්ව ඇත. | අදාළ සියලු භාණ්ඩ හඳුනාගෙන මණ්ඩලය වෙත විධිමත්ව භාරගෙන ගබඩා කිරීමටත් ගිණුම්ගත කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (iv) | ව්‍යාපෘතියේ මූලික අරමුණ භූගත ජල පරිහරණය හේතුවෙන් වකුගඩු රෝගය ව්‍යාප්තව ඇති අනුරාධපුර, පොලොන්නරුව හා මොණරාගල යන දිස්ත්‍රික්ක 03 හි භූ ගත ජලයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක දත්ත තාවකාලිකව ලබා ගැනීම හා ඒවා අධීක්ෂණය කිරීම වූ අතර එහිදී මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේ ඉදිකරනු ලබන දත්ත මධ්‍යස්ථානය වෙත අදාළ දත්ත කාලීන වශයෙන් සම්ප්‍රේෂණය කරනු ලැබිය යුතු විය. එසේ වුවද එම දත්ත යොදාගෙන රටේ වර්තමානයේ සැලකිය යුතු මට්ටමේ ගැටලුවක් වන භූ ගත ජලයේ පවතින ප්‍රමාණාත්මක හා ගුණාත්මක ගැටලු සඳහා විසඳුම් ලබා දෙන ආකාරය පිළිබඳ උපායමාර්ග මෙම | මෙම ව්‍යාපෘතිය හරහා අදාළ නියමු ප්‍රදේශවල විශාලතම භූගත ජලය උකහා ගන්නා ග්‍රාමීය සහ ප්‍රධාන ජල සම්පාදන ව්‍යාපෘතියන්හි භූගත ජල මූලාශ්‍ර, මුහුදු ජලය මිශ්‍රවීම හරහා ලවණතාවය වැඩි වන ප්‍රදේශ ප්‍රධාන වශයෙන්ම සැලකිල්ලට ගැනුණි. එමගින් එම ජල මූලාශ්‍රවල සිදුවන ගුණාත්මකභාවය සහ ප්‍රමාණාත්මක වෙනස්කම් සහ විශ්ලේෂණ පදනම්ව එම ජල මූලාශ්‍ර කළමනාකරණය සහ සංවර්ධනය කිරීම සඳහා වැඩසටහන් කිහිපයක් ජල සම්පත් මණ්ඩලය මගින් සැලසුම් කොට ඇත. මේ යටතේ ජාතික ප්‍රජා ජල දෙපාර්තමේන්තුවේ හා ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සමඟ සම්බන්ධීකරණය වී කටයුතු කෙරේ. මෙම තොරතුරු අදාළ භූගත ජලය සම්බන්ධයෙන් සිදුකරනු ලබන | සැලසුම් සකස්කර ක්‍රියාත්මක කිරීම තුළින් ව්‍යාපෘතිය මඟින් ලබාදුන් සම්පත් ඵලදායී ලෙස භාවිතා කළ හැකි බැවින් ඒ සඳහා පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ව්‍යාපෘති යෝජනාව තුළ හෝ මෙම දත්ත පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ වගකීම දරන මණ්ඩලය සතුවද නොතිබුණි. ඒ අනුව කිසිදු ආර්ථික ප්‍රතිලාභයකින් තොරව යුරෝ මිලියන 20.06 ක ණය මුදලක් ඊට අදාළ පොලියද සමග 2025 වර්ෂය සිට ගෙවීම් කිරීමට ශ්‍රී ලංකා රජයට සිදු වී තිබුණි. | පර්යේෂණයන් සහ අධ්‍යනයන් සඳහා යොදා ගැනීමට මණ්ඩලය හරහා සැලසුම් සකස් කර ඇත. | |
| (v) | ව්‍යාපෘතිය යටතේ යුරෝ 2,240,030,328 කට හෙවත් රුපියල් මිලියන 397.98 කට මිලදී ගත් අධි තාක්ෂණික විදුම් යන්ත්‍ර (MS – FT drilling mountel truck) 02 ක් භාවිතයේ යොදවා තිබූ අතර ව්‍යාපෘතිය අවසන් වීමෙන් පසු මෙම යන්ත්‍ර 02 මණ්ඩලයට පවරා දී තිබුණද. විගණිත දිනය වූ 2023 මාර්තු 21 වන විටත් එම යන්ත්‍රවල නඩත්තුව සහ ක්‍රියාකරවීම සම්බන්ධ ගැටලු හේතුවෙන් මණ්ඩලය විසින් කිසිදු කාර්යකට භාවිතා නොකර නිෂ්කාර්යව තබා තිබුණි. | විදුම් යන්ත්‍ර 02හි විදුම් කටයුතු සම්බන්ධව මණ්ඩලයේ විදුම් නිලධාරීන් හතරදෙනෙකු පූර්ණ කාලීනව යොදවා පුහුණු කළ අතර ඔවුන් අදාළ නිපුණත්වය ලබා ගත් බව කොන්ත්‍රාත්කරු යටතේ සම්බන්ධ වූ විදුම් විශේෂඥයින්ගෙන් තහවුරු විය. ඒ අනුව යන්ත්‍ර දෙකෙහි විදුම් කටයුතු මණ්ඩලයේ විදුම් නිලධාරීන් මඟින් සිදු කර ගත හැක.<br>මෙම යන්ත්‍ර භාවිතා කිරීමට නොහැකි වුයේ එම යන්ත්‍ර නඩත්තුව සහ ක්‍රියාකරවීම සම්බන්ධ අධික වියදම නිසාය. | මෙම අධි තාක්ෂණික විදුම් යන්ත්‍ර භාවිතයට ගැනීම සඳහා යෝග්‍ය වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |
| (vi) | වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම් හා කොන්ත්‍රාත්කරු වන නෙදර්ලන්තයේ සමාගම අතර ඇති කරගෙන තිබූ ගිවිසුම ප්‍රකාරව, ස්ථාපිත කරනු ලබන ස්වයංක්‍රීය දත්ත සමීක්ෂණ පද්ධතිය සඳහා වසර 05 ක සත්කාරකත්වය (Hosting Website) එම සමාගම විසින් ලබා දිය යුතු විය. ඒ අනුව අදාළ සත්කාරකත්වය කොන්ත්‍රාත්කරුගේ රටෙහි සමාගමක් මගින් ලබා ගත යුතු බවට කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබුණු | මෙම දත්ත පද්ධතිය ශ්‍රී ලංකා ටෙලිකොම් (SLT) හෝ වෙනයම් දේශීය ආයතනයක් හරහා සිදු කළ හැකිද යන ගැටලුව කේවල් කිරීමේ කමිටුවට (CANC) ඉදිරිපත් වුවද තාක්ෂණික ගැටළු මත ඔවුන්ගේ සත්කාරීත්වය යටතේ පවතින server හරහා සිදුකළ යුතු බවට එහිදි එකඟ වී ඇත.<br>ඒ අනුව ව්‍යාපෘතිය නිම කරනු ලැබූ 2022 දෙසැම්බර් 31 සිට 2027 දෙසැම්බර් 30 දක්වා වසර 5ක කාලසීමාවකට සත්කාරකත්වය හිමිවන අතර | අධි සංවේදී දත්ත වෙත සීමාවකින් තොරව විදේශ ආයතන වලට ප්‍රවේශ වීමට ඇති හැකියාව මඟින් භූගත ජල සම්පත කෙරෙහි ඇතිවිය හැකි අහිතකර බලපෑම් පාලනයට සුදුසු ප්‍රතිකර්ම යෙදිය යුතුය. |

යෝජනාවට එකග වී තිබුණි. මේ හේතුවෙන් අධි තාක්ෂණික පසුබිමක් තුළ ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු මණ්ඩලයේ නිලධාරීන් විසින් සිදුකරනු ලැබුවද ශ්‍රී ලංකාවෙන් ලබා ගන්නා දත්තවල පාලනය නෙදර්ලන්ත සමාගම් සතු වීමේ අවදානමක් පැවතුනි. මීට අමතරව අදාළ දත්ත පද්ධතියේ සත්කාරකත්වය 2027 දෙසැම්බර් 30 දින අවසන් වන ලෙස ලිඛිත එකගතාවයකට එළඹ තිබුණද වසර 5 න් පසුවද සත්කාරකත්වය සඳහා එම සමාගම වෙතම පැවරීමට සිදුවීමේ අවදානමක්ද පැවතුණි.

එහි ලිඛිත එකඟතාවෙන් සිදු කෙරිණි. තවද පළමු වසර 5 අවසන් වූ පසුව ද ඔවුන්ගේ තාක්ෂණික සහභයෝගය (Technical Assistance) ලබා දෙන බවත් උත්ප්‍රේරණයක් කිරීම (Upgrade) අවශ්‍ය වුවහොත් පමණක් එහි පිරිවැය දැරීමට සිදු වන බවත් දන්වා සිටින ලදි.

එසේම මෙම වෙබ් පෝටලය Turkey ව්‍යාපෘති පසුබිම තුළ ඔවුන් විසින් program කර ස්ථාපනය කළ අතර එහිදී එහි මෙහෙයුම් ක්‍රියාදාමය සහ විශේෂාංගයන් කරනු ලැබු ඉල්ලීම් මත පදනම්ව සිදු කෙරිණි. ඒ අනුව මාර්ග ගත වෙබ් පෝටලය මේ වන විට ජල සම්පත් මණ්ඩලයේ නිලධාරීන් විසින් ස්ථාපනය කරන ලද දත්ත මධ්‍යස්ථානයේදි අවශ්‍ය මෙහෙයුම් කටයුතු සිදුකරගෙන යනු ලබයි.